www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධය යලි පැන නැඟීම ගැන සසප රැස්වීම අනතුරු අඟවයි

## SEP public meeting to warn of the dangers of war in Sri Lanka

**2004 සැප්තැම්බර් 14**

සිවිල් යුද්ධය නැවත පැන නැගීමේ තර්ජනය ගැන අනතුරු ඇඟවීමට සහ වැඩ කරන ජනයාගේ සාමය, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ ශිෂ්ඨ ජීවන කොන්දේසි පිලිබඳ අභිලාශයන් ඉෂ්ට කල හැකි සමාජවාදී ඉදිරි දර්ශනය ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) මෙම සිකුරාදා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික සහ සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් ප්‍රධාන දේශනය පවත්වයි. පසුගිය දශක දෙක තුල මහා පරිමාන විනාසයට තුඩු දුන් සහ 65,000 ජනයා ඝාතනයට හේතුවූ ගැටුම අවසන් කිරීමට කොලඹ පාලන කල්ලිය අසමත්වීමට යටින් පවත්නා හේතු ඔහු විභාග කරයි.

මහා සංගතවල නායකයන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් පසුගිය එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව (යූඑන්එෆ්) සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය 2002 වෙඩි නැවැත්වීමේ ගිවිසුමක් අත්සන් කරන ලදි. දූපත ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීමේ සහ භූගෝලීය නිෂ්පාදන ක්‍රියාදාමයට අන්තර්ග්‍රහනය කර ගැනීම අරමුනු කර ගත් වාර්ගික බලය බෙදා ගැනීමකට පදනම දැමීම මෙහි අරමුන විය.

එල්ටීටීඊයට දෙනු ලබන මොනයම්ම හෝ සහනයක් පාවාදීමක් ලෙස සැලකූ මිලිටරි ප්‍රභූවේ සහ විවිධාකාර සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම්වල විරුද්ධත්වයට එක්සත් ජාතික පෙරමුනට (යූඑන්ෆ්) ආරම්භයේදීම මුහුන දීමට සිදු විය. යුද්ධය මගින් වාසි ලැබූ රාජ්‍ය නිලධරයේ සහ ව්‍යාපාර ස්ථරයන් නියෝජනය කරනු ලැබූ මෙම බලවේග, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ සහාය ලබාගෙන ආන්ඩුව අස්ථාවර කිරීමේ ක්‍රියාදාමයක් දියත් කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගිය පෙබරවාරියේදී එය විසුරුවා හරිනු ලැබීය.

නමුත් අස්ථාවර සුලුතර ආන්ඩුවක නායකයා ලෙස බලයට පැමිනි කුමාරතුංගට ඇයගේ පෙරගමන්කරුවන් මුහුන දුන් විරෝධාභාසයටම මුහුන දීමට සිදු විය. රට තුලට විදේශ ආධාර සහ ආයෝජන කැඳවා ගැනීමේ අරමුන සහිතව එල්ටීටීඊය සමඟ සාකච්ඡා නැවත ආරම්භ කිරීමට කුමාරතුංග උත්සාහ දැරීය. නමුත්, එල්ටීටීඊය සහ ඉන් කැඩී ගිය නැගෙනහිර වී මුරලිදරන් (කරුනා) විසින් නායකත්වය දෙනු ලැබූ කන්ඩායමත් අතර මිලිටරි ගැටුමකට හිතාමතාම පොහොර දැමීම මගින් වෙඩි නැවැත්වීමට යටින් වල කැපීමට ඇගේ ස්වෝත්තමවාදී සහකරුවන් - මිලිටරිය සහ ජනතා විමුක්ති පෙරමුන - වැඩ කරමින් සිටී.

එක්සත් ජනපදය සහ එහි මූලෝපායාත්මක සහකරුවා වන ඉන්දියාවේ දෙබිඩි පිලිවෙත මඟින් මිලිටරිය ශක්තිමත් වී සිටී. ප්‍රසිද්ධියේ සාම සාකච්ඡා නැවත ආරම්භකිරීමට වොෂින්ටනය සහ නව දිල්ලිය සහාය දක්වන නමුත් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල හස්තය ශක්තිමත් කිරීමට එය වැඩ කරමින් සිටී.

ශ්‍රී ලංකාවේ වැඩ කරන මහජනතාව අති බහුතරය නැවත යුද්ධය ඇතිවීමට විරුද්ධය. නමුත් පාලක පන්තිය වාර්ගික දේශපාලනයේ කෙතරම් ගිලී ඇත්දැයි කිවහොත් ලේ වැකි ගැටුමකට රට නැවත ඇද වැටීම වැලැක්වීමට ඔවුන් අසමත්ය. එවැනි බේදවාචකයක් ඇතිවීම වැලැක්වීමට සියලු ධනපති පක්ෂ සහ ඔවුන්ගේ 'වාම' සහකරුවන්ගෙන් මුලුමනින්ම කැඩී සියලු කම්කරුවන් ඒකාබද්ධ කරන සම්පූර්න වෙනත් දේශපාලන මූලෝපායක් අනුගමනය කිරීම අවශ්‍යය. එය සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවන්ගේ පොදු පන්ති අවශ්‍යතාවයන් සඳහා සටන් කරන සමාජවාදී ඉදිරි දර්ශනයයි.

වර්තමාන ආවෘත අන්තරයෙන් මිදී ගැනීමට මඟෘක් සොයන කම්කරුවන්ගෙන්, තරුන ජනයාගෙන් සහ බුද්ධිමතුන්ගෙන් අප ඉල්ලා සිටින්නේ සසප ප්‍රසිද්ධ රැස්වීමට සම්බන්ධ වන ලෙසත් සහ සාකච්ඡාවට ක්‍රියාශීලීව මැදිහත් වන ලෙසත් ය.

ස්ථානය: මහජන පුස්තකාල ශ්‍රවනාගාරය,
කොළඹ 7.
වේලාව: සැප්තැම්බර් 17 සිකුරාදා සවස 4.00 ට

© www.wsws.org